# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 158 — 1975 අප්‍රේල් 04 වැනි සිකුරාද — 1975.04.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| පනත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම ... ... ... | 41 |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දන්වීම ... ... | — | බුදල් නඩු පිළිබඳ දන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම ... ... ... | — | නීති අධ්‍යාපන සභාවේ දන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු හැසි පිළිබඳ නිවේදන ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම ... | — | විවිධ දන්වීම ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම ... ... | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම්

### බස්නාහිර පළාත

### පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම

පානදුර දිස්ත්‍රික් උසාවි නඩු ශාලාවේදීය

1. පැල්පොල පදිංචි කුඹුකගේ ජේන් නෝනා, 2. එම ගම පදිංචි විතානගේ පියතිස්ස ජයතිලක.......................පැමිණිලිකරුවෝ.

නොම්මරය: 11850 එදිරිව

1. පමුණුගම පදිංචි කුඹුකගේ චන්ද්‍රසේන හා පෙරේරා සහ තවත් අය ........................ විත්තිකරුවෝ.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ 1, 3 හා 4 වීත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1975ක් වූ අප්‍රේල් මස 24 දින 10.30ට පමුණුගම ඉඩම් පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම දේපල විකුණනු ලබන්නේ 1 හා 3 විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුවන්ට අයවිය යුතු වැඩිදියුණු කිරීමේ වන්දි වශයෙන් රු. 2,454.58 ද, 1, 3 හා 4 විත්තිකරුවන්ගෙන් රු. 443.64 ද, (මින් මෙම අධිකරණයෙහි බැඳ ඇති රු. 450 අඩුව) හිඟ සම්පූර්ණ මුදල වන රු. 2,448.22 හා සාක්ෂි ගාස්තු රු. 227.61 ද අයකර ගැනීම සඳහාය.

### විකුණනු ලබන දේපල

1 හා 3 විත්තිකරුවන්ට අයත් දේපළ:

(1) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුරා තල්පිටි දෙබද්දේ, පමුණුගම පිහිටි ඊ. ඒ. ඇම්. ගුණතිලක අවසර ලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද 1971 ඔක්තෝබර් 23 සහ 29 වෙනි දින සාදන ලද අංක 356 දරණ පානදුර දිස්ත්‍රික් උසාවියේ අංක 11850 දරණ බෙදුම් නඩුවේ අවසාන පිඹුරේ පෙනෙන දෙල්ගහ වත්තේ අංක 3 දරණ බිම් කට්ටියට මායිම්: ඊශානට මහ පාර ද, ගිනිකොනට: ගොරකගහ ඕවිට සහ කලින් කුඹුර දුන් ඔවිට ද, නිරිතට: මෙම ඉඩමේ අංක 4 දරණ කට්ටිය ද, වයඹට: මෙම ඉඩමේ අංක 2 දරණ කට්ටිය ද යන මායිම් තුළ පර්චස් විසිහයකුත් දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 26.15) ක් විශාල ඇති බිම් කට්ටිය සහ එහි තුළ තිබෙන සියළුම ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිත් සම්පූර්ණයෙන් වේ. පානදුර ඉඩම් කාර්යාලයේ එජ 28/155 වෙළුමේ මුළ ඉඩම ලියාපදිංචි කර ඇත.

4 වෙනි විත්තිකරුට අයිති දේපළ:

(2) ඉහත කී පමුණුගම පිහිටි එකී අවසාන පිඹුරේ පෙනෙන දෙල්ගහවත්තේ අංක 5 දරණ බිම් කට්ටියට මායිම්: ඊශානට: මෙම ඉඩමේ අංක 4 දරණ බිම් කට්ටියද, ගිනිකොණට: කලින් කුඹුර දුන් ඕවිටද, නිරිතට: මෙම ඉඩමේ අංක 6 දරණ කට්ටියද, වයඹට: මෙම ඉඩමේ අංක 1 දරණ කට්ටියද යන මායිම් තුළ පර්චස් දහ තුනකුත් දශම බින්දුවයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 13.075) ක් විශාල බිම් කට්ටිය සහ එහි තුළ තිබෙන සියළුම දේ පරිපූර්ණයෙන් ද, එකී අංක 356 දරණ පිඹුරේ අංක 1 ට ලකුණු වී ඇති බිම් තීරුව පාරක් හැටියට පාවිච්චි කිරීමේ අයිතිය සමග වේ. පානදුර ඉඩම් කාර්යාලයේ එජ්. 28/155 වෙළුමේ මුළු ඉඩම ලියාපදිංචි කර ඇත.

වර්ෂ 1975 මාර්තු 10 වැනි දින,

4-93—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

පිස් කල් අංකය : 5/74.

අනුරාධපුර දිසා අධිකරණයේ දීය

අනුරාධපුර, නව නගරයේ පදිංචි ඊවට් සේනානායක ........................පැමිණිලිකරුය.

නොම්මරය : 8380 එදිරිව

පරසන් ගස් වැව, කාටුමාන් කුලමේ පදිංචි දිසානායක මුදියන්සේ ලාගේ බණ්ඩාගේ ජයතිලක................................විත්තිකාරයා.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ, විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1975 මැයි මස 20 වෙනි දින අඟහරුවාද දින පෙරවරු 11ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

උපලේඛනය

උතුරු-මධ්‍යම පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාතේ, කැඳ කෝරලේ ඉහල වැව් තුලානේ කට්ටමාන් කුලමේ පිහිටි, කට්ටමාන් කුලම කැලේ නමැති ඉඩමට මායිම් :— උතුරට : කැබැලි අංක 2 කිව් 2 ද, නැගෙනහිරට : කැබැලි අංක 2කිව් 3 සහ 2 කිව් 4 ද, දකුණට : ඊ. පී. 335887 සහ ඊ. පී. 336373 ද, බස්නාහිරට : ලොට් 2කිව් 5 ද, මෙහි මායිම් තුළ අක්කර 5යි, රූඩ් 1, පර්චස් 3ක් විශාල වූ ඉඩම.

ජී. බී. ඊ. ගුරුසිංහ,
පිස් කල්.

වර්ෂ 1975 මාර්තු මස 20 වෙනි දින දීය.

4-94—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා වේ.

4. මුදල් ගණුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැළකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" කඩදාසියේ එක පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන් කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 20 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 220 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 440 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන්, කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුය.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු *—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... ... | 36 0 | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... ... | 43 50 | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 50 | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 60 | 0 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලග ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කායාීාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කායාීංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු ... | 75.03.07 | සිකුරාද | ... | 75.02.28 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.14 | සිකුරාද | ... | 75.03.07 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.21 | සිකුරාද | ... | 75.03.14 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.27 | බ්‍රහස්පතින්ද | ... | 75.03.21 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 75.04.04 | සිකුරාද | ... | 75.03.27 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 75.04.11 | සිකුරාද | ... | 75.04.04 | සිකුරාද | දවල් 12.00 |
| | 75.04.18 | සිකුරාද | ... | 75.04.11 | සිකුරාද | දවල් 12.00 |
| | 75.04.24 | බ්‍රහස්පතින්ද | ... | 75.04.18 | සිකුරාද | දවල් 12.00 |
| මැයි ... | 75.05.02 | සිකුරාද | ... | 75.04.24 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 75.05.09 | සිකුරාද | ... | 75.05.02 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.16 | සිකුරාද | ... | 75.05.09 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.23 | සිකුරාද | ... | 75.05.16 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.30 | සිකුරාද | ... | 75.05.23 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි ... | 75.06.06 | සිකුරාද | ... | 75.05.30 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.13 | සිකුරාද | .. | 75.06.06 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.20 | සිකුරාද | ... | 75.06.13 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.27 | සිකුරාද | ... | 75.06.20 | සිකුරාද | දවල් 12.00 |

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී